# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/38 - 2016 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2016.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KWDS/LND/01/ACQ/03/2014.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/4/2014/LO/230.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම*/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ* පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරලය, උඩ පත්තුවේ පොතුපිටිය උතුර ග්‍රාම නිලධාරී වසමේ පහළ පොතුපිටිය ගමේ අ. ග. සි. 936 හි, අතිරේක අංක 11 හා පත්‍ර අංක 11 හි කැබලි අංක 1068 වශයෙන් ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1075 ක් පමණ වූ, පොල් කොරටුව නමැති ඉඩම,

පොදුජන කටයුත්ත : පොතුපිටිය පොලිස් මුරපොළ ස්ථාපිත කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

01. අ. ග. සි. 936 හි කැබලි අංක 1068 අතිරේක අංක 11 හා පත්‍ර අංක 11

ඉඩමේ නම: පොල් කොරටුව; හිමිකම් කියන අය: එච්. එම්. සුසන්ත හේරත්, විද්‍යාල මාවත, පොතුපිටිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1075.

ඉහත සඳහන් ඉඩමට* පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2016/11/23 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී* ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. ඩී. එල්. උදයකුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන ප්‍රදේශීය ලේඛම් කොට්ඨාසය.

2016 සැප්තැම්බර් මස 28 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1769

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24371– 25 - (2016/10)

සංශෝධනය යි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර අංක 1910/3, 2015/04/17 හි iii වැනි කොටස - ඉඩම් 4/ 886 දැන්වීම පහත පරිදි සංශෝධනය විය යුතුය.

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම/පරවශතාවේ විස්තර :*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, උඩ පත්තුවේ කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාටුවාගල ග්‍රාම නිලධාරී වසමට අයත් අ. ග. සි. 325 හි, පත්‍ර අංක 23 හි ලොට් අංක 391 ප්‍රමාණය හෙක්ටයාර් 0.2023 ලෙස සඳහන් ඉඩම කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය ඉදි කිරීම සඳහා රජයට අත්කර ගැනීමට අදහස් කරයි.

ප්‍රාදේශීය ලේකම්,
කිරිඇල්ල.

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-1770

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.